Founded
1981

Incorporated
1989

# National Construction Association of Sri Lanka

*"Idikireem Medura", No. 350 A, Pannipitiya Road, Pelawatta, Battaramulla, Sri Lanka*
*Tel: 114 422222 , 011 2784355*
*Web: www.ncasl.lk E-mail: info@ncasl.lk*

2025.05.22

සියලුම ශාඛා සභාපතිවරුන් හා සාමාජික භවතුන් වෙත,

**<u>අපගේ සාමාජිකයින්ට පහසුකම් සැලසීමට සහ පසුගිය කාලය තුළ ඉදිකිරීම් කර්මාන්තය වැඩිදියුණු කිරීමට NCASL විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග.</u>**

1. ආර්ථික ආර්බුධය හමුවේ 2022 වර්ෂයේදී ව්‍යාපෘති අතර මග නතර කිරීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය ද අතර මග නතර විය. එම ව්‍යාපෘතියේ ගිවිසුම් වල කොන්දේසි ඉදිකිරීම් කරුවනට හිතකර වන ආකාරයට වෙනසක් කර ගැනීමටත් එම ව්‍යාපෘති සඳහා මුදල් නොගෙවීම පිළිබඳවත් එවක අමාත්‍යාංශ ලේකම්වරයා සමග අපගේ සභාපති තුමා නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්විය. එම හිඟ මුදල් නොගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය තවදුරටත් කටයුතු කරන අතර, ළඟම පාසැල හොඳම පාසැල, I-Road ආදී ව්‍යාපෘති වල හිඟ මුදල් පිලිබඳවද අදාළ බලධාරීන් සමග සාකච්ඡා කරමින් පවතී.

2. ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් අමුද්‍රව්‍ය වල මිල ඉහල යාම හේතුවෙන් CIDA බුලටිනයේ Indices අනුව ගෙවිය යුතු මුදල (Price Fluctuation) නිවරදි නොවීම නිසා අප සභාපති තුමා ඒ පිලිබඳව සොයා බැලූ අතර CIDA ආයතනය මාසිකව නිකුත්කරන Indices නිවැරදි කිරීමට සහ අදාල වන ආකාරයට අමුද්‍රව්‍ය වල මිල ලබාගැනීමටත් CIDA ආයතනය එකඟ කරවා ගැනීමට හැකිවිය. තවද CIDA සභාපතිවරයා සමඟ සාකච්ඡා කොට එම බුලටිනයේ නිවැරදිතාවය 75% කට වඩා මේ වන විට ලඟා කරගෙන ඇත. ඒ සඳහා ඔබට ඇති හොඳම සාක්ෂිය නම් 2023 වර්ෂයේ නිකුත් කරන ලද බුල්ටිනයත් මෙදින වල නිකුත් වන බුල්ටිනයකුත් සංසංදනය කිරීම වන අතර, එහිදී අප සංගමය විසින් සිදුකරන ලද වෙනස්කම් මනාව නිරීක්ෂණය වේ.

3. 2022 වර්ෂයේ පටන්ගත් ආර්ථික අර්බුධය හමුවේ ඉදිකිරීම් කරුවන්ට CIDA ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට සපුරාලිය යුතු අවශ්‍යතා පහත සඳහන් ලෙස ලිහිල් කිරීමට CIDA ආයතනය පොළඹවා ගැනීමට අප සභාපති තුමාට හැකිවිය.
    a. 2020.01.01 න් පසු ලියාපදිංචිය අලුත් නොකළ C4 සිට C9 ශ්‍රේණිගත කොන්ත්‍රාත්කරුවන්ගේ නොගෙවූ CIDA ලියාපදිංචි ගාස්තුව සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත.
    b. 2020.01.01 දිනට පසු ලියාපදිංචිය අලුත් නොකළ C1, C2 සහ C3 ශ්‍රේණිගත කොන්ත්‍රාත්කරුවන්ගේ CIDA ලියාපදිංචි ගාස්තු මාස 6ක් ඇතුළත වාරික දෙකකින් ගෙවීමට අවසර ඇත. (කරුණාකර අමුණා ඇති 2024.05.30 දිනැති අංක: 1/2/1-BD දරණ අමුණා ඇති CIDA ලිපිය බලන්න). මෙය තව වසරක් සඳහා දීර්ඝ කිරීම සඳහා ඉල්ලීමක් කර ඇත.

4. ගරු සභාපති ඩැරින්ටන් පෝල් මහතාගේ ඉල්ලීම පරිදි කොන්ත්‍රාත්කරුවන් ශ්‍රේණිගත කිරීමේ ලකුණු යෝජනා ක්‍රමය පහත පරිදි ලිහිල් කර ඇත.

a. මූල්‍ය ධාරිතාව - C4 ශ්‍රේණිය දක්වා සහතික කළ බිල්පතක් ලෙස සැලකේ
b. තාක්ෂණික ධාරිතාව (මානව සම්පත්) - වසර 1ක කාලයක් සඳහා ලිහිල් EPF වාර්තා.
c. තාක්ෂණික ධාරිතාව (වැඩ පළපුරුද්ද) - වසර 1 ක කාලයක් සඳහා ලිහිල් කර ඇත.
d. සංවිධාන කළමනාකරණය - වසර 1 ක කාලයක් සඳහා ලිහිල් කර ඇත.

(කරුණාකර අමුණා ඇති 2024.01.25 දිනැති Ref No: 1/2/1-BD දරන CIDA ලිපියෙහි යොමු කරන්න). මෙය තව වසරක් දීර්ඝ කිරීමට ඉල්ලීමක් කර ඇත.

මෙම සහන කාලය 2024 දෙසැම්බර් මස අවසන් වුවද නැවත වරක් CIDA අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කර එම සහන කාලය (ඉදිකිරීම් කාරිය සුරක්ෂිත තාව හා වෘත්තීය, සෞඛ්‍ය, ආරක්ෂාව හැර) තවත් වසරකින් දීර්ඝ කිරීමට අප සභාපති තුමන්ට හැකිවිය. මෙයින්, අපගේ සාමාජිකයින් නොවන ඉදිකිරීම් කරුවන්ටද මහඟු ප්‍රයෝජනයක් ලැබේ.

5. රට මුහුණ දුන් ආර්ථික අර්බුදය හමුවේ අතර මග නවතා දමන ලද ව්‍යාපෘති ආරම්භ කිරීමටත්, නව ව්‍යාපෘති ආරම්භ කර ඉදිකිරීම් කර්මාන්තය ශක්තිමත් කිරීමටත් පසුගිය රජය මෙන්ම නව රජය සමගත් සභාපති තුමා සාකච්ඡා කරමින් පවතී.

6. පසුගිය කාලයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට බලපාන චක්‍රලේඛන පිළිබඳව සහ ඒවැනි ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනයට සිදු කල යුතු වෙනස්කම් පිළිබඳව ඉහල මට්ටමේ රාජ්‍ය නිලධාරීන් සමඟ කල සාකච්ඡා ඉතා සාර්ථක විය. තවද රාජ්‍ය ආයතන මඟින් CIDA සම්මත ලංසු ලේඛන වෙනස් කිරීම් වලට මැදිහත් වෙමින් ඒවා නිවරදි කිරීමට සභාපති තුමා මහත් වෙහෙසක් ගනී.

7. 2024 වර්ෂයේ පල කරන ලද ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ඉදිකිරීම් කරුවන්ට හා ඉදිකිරීම් කර්මාන්තයට අහිතකර වගන්ති රාශියක් හඳුනාගනිමින් එම ගැටළු විසඳා ගැනීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිසම හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ඉහල නිලධාරීන් සමඟ මෙන්ම, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් තුමා හා ගරු ඇමතිතුමා සමඟ සාකච්ඡා කරමින් සියළු ඉදිකිරීම් සඳහා ලංසු ඉදිරිපත් කිරීමේදී සමානාත්මයක් ඇති කිරීම සඳහා කටයුතු කරමින් සිටියි. මෙහිදී ප්‍රධාන වශයෙන් බලපාන කරුණ වනුයේ ලංසු ඇගයීමේදී සලකා බලනු ලබන සමාන සවභාවයෙන් යුතු ව්‍යාපෘතියක් නිම කිරීම සලකා බැලීමයි. නමුත් ආර්ථික අර්බුදය හමුවේ අමුද්‍රව්‍යවල මිල සියයට සියයක් ඉහල යෑම නිසා සමාන ස්වභාවයේ ව්‍යාපෘතියක් සැලකීමේදී ඉදිකිරීම් කරුවන්ට විශාල අසාධාරණයක් සිදුවන් නිසා මෙම වගන්තියට සංශෝධනයක් කරන ලෙසද එය යෝජිත් ව්‍යාපෘතියේ වටිනාකමින් 60%ක් ලෙසට සලකන ලෙසට අප සභාපති තුමා විසින් ඉල්ලීමක් කර ඇති අතර දැනට සංශෝධනය වෙමින් පවතින SBD01, SBD02, SBD03 සහ SBD04 සම්මත ලංසු ලේඛන වලට එය ඇතුලත් කිරීමට CIDA සභාපති වරයා එකඟ වී ඇත. තවද ප්‍රජා පාදක සමිති වලට මෙතෙක් ලබාදී තිබූ මිලියන 5ක සීමාව මිලියන 2 දක්වා අඩුකිරීමට අපගේ සභාපතිවරයා ගෙන ගිය සටන අද සාර්ථක වී ඇත.

8. පළාත් ශාඛාවල වාර්ෂික ත්‍යාග ප්‍රධානෝත්සව වලදී මධ්‍යම රජයේ දේශපාලන අධිකාරිය හා ගරු ආණ්ඩුකාර තුමා ඇතුළු පළාත් දේශපාලන අධිකාරිය මෙන්ම මධ්‍යම රජයේ සහ පළාත් නිලධාරීන් හමුවේ නොබියව, නොපැකිලව අදහස් දක්වමින් සිදුවන්නාවූ අසාධාරණ කම් නිවරදි කිරීමට අපගේ ගරු සභාපති තුමා ඉල්ලීම් කර ඇත.

9. CGF ආයතනයේ අත්තනෝමතික හැසිරීම් නිසා CGF ආයතනය විසින් නිකුත් කරන බැඳුම්කර සහ ඇපකර (Bonds & Guarantees) රාජ්‍ය ආයතන පිළිනොගන්නා තත්වයට පත්වී තිබුනද, අද ඉදිකිරීම්

කරුවන්ට ගෞරවාන්විතව එම පහසුකම් ලබාගැනීමට සභාපති තුමාගේ මැදිහත්වීමෙන් අවස්ථාව උදා කර ඇත. තවද ඉදිරියට ඒවා ලබාගැනීමට අප සංගමයේ නිර්දේශය අනිවාර්ය කිරීමටද ක්‍රියා කරනු ලැබේ.

10. පසුගිය වසර දෙක තුල ඉදිකිරීම් කරුවන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා අපගේ සැපයුම් කරුවන් මැදිහත් කරගෙන සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදි. මෙහිදී INSEE, Alumex, Swisstek, Phoenix, Ranki ආදී ආයතන අප සමඟ අත්වැල් බැඳගත් බවද සිහි කිරීමට කැමතිය. තවද ශාඛා කාර්යාල වැඩමුළු වල දී ඔවුන්ගේ අනුග්‍රහය ලබා ගැනීමට ද අපගේ සභාපති වරයා කටයුතු කරයි.

11. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා PCA3 පෝරමය අනිවාර්ය කර ඇත. නමුත් එය ඉදිකිරීම් කරුවනට මහත් හිසරදයකි. එමනිසා එම අවශ්‍යතාවය ඉවත් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් තුමා සමග සාකච්ඡා කරමින් සිටී.

12. අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කරන ලදී. තවද, අමාත්‍ය මණ්ඩලය ද ඒ පිළිබඳව සාකච්ඡා කර ඇති බව අපගේ අවධානයට ලක්ව ඇත. මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට නිර්දේශ ලබා ගැනීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවට අපගේ ගරු සභාපති තුමාටද ආරාධනා කර තිබූ අතර එහිදී කරුණු විශ්ලේෂණය කරමින් සාකච්ඡාවට සහභාගී වූ සියළු දෙනාටම පැන නැගී ඇති ප්‍රශ්න පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කරන ලදි. තවද ලංසු ඇගයීමේදී සමාන ව්‍යාපෘති පිළිබඳවද කරුණු ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, අප විසින් ඒ පිළිබඳව දැනුවත් කර භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් තුමා වෙත අපගේ 2025.03.27 දිනැති ලිපිය යොමු කර ඇත. තවද, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩුවෙන් ව්‍යාපෘති ලබාදීමේදී ඇති වන අවුපාඩුද එම සාකච්ඡාවේදී විස්තර කරන ලදි.

මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ කරුණු 26ක් අතරින් පහත සඳහන් ප්‍රධාන කරුණු ඉස්මතු කර ඇත.

a. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ක්‍රියාත්මක වූ 2022.10.01 දිනට පෙර අවසන් කරන ලද ඔවුන්ගේ ලංසු මත කොන්ත්‍රාත්තු ලබාදුන් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් එම බද්දෙන් බැහැර කිරීම සහ එම බදු ඉවත් කිරීමට නියෝගයක් නිකුත් කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නියෝග කිරීම හිමිකම් කියයි. මෙම දුෂ්කර අවස්ථාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට මෙය සහනයක් වනු ඇත.
b. 2020.10.09 දින 03/2020 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය යටතේ "ගෘහස්ථ කර්මාන්ත සඳහා සහාය දැක්වීමේ ප්‍රතිපත්තිය" යන ශීර්ෂ පාඨයෙන් දක්වා ඇති පූර්ව විධිවිධාන අනුව ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා 15% අඩු ලංසු ප්‍රතික්ෂේප කිරීම. පසුගිය කාලය තුළ බොහෝ අඩු මිල කොන්ත්‍රාත්තු කොන්ත්‍රාත්කරු විසින් නවතා දැමූ අතර නිම කරන ලද ව්‍යාපෘතිවල ගුණාත්මක භාවය සමාන මට්ටමක පැවති බව අපට නිරීක්ෂණය විය. පුරවැසියන්ට සහ රජයට සිදුවන මෙම පාඩුවලට අමතරව විනිශ්චය සහ බේරුම්කරණ ක්‍රියාවලින් සඳහා රජයට විශාල මුදලක් වැය වී ඇත.
c. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) විසින් නියම කරන ලද නියමයන් සහ සම්මත ලංසු ලේඛන (SBDs) හි දක්වා ඇති කොන්දේසි සහ අනුකූල නොවන අවස්ථා සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් වන සියලුම පාර්ශ්වයන් දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයක් නිකුත් කිරීම, CIDA විසින් බලාත්මක කිරීමට යොමු කිරීම. CIDA පනතේ 56 වගන්තිය.

d. 2017.10.24 දින NPC අතිරේකයේ 1 විකල්පය 2.1 ට අනුකූලව, සේවා යෝජකයාට පිළිගත හැකි බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි විරහිත ඇපකරයකට එරෙහිව, රඳවා ගැනීමේ සීමාවට ළඟා වූ පසු, ප්‍රසම්පාදන ආයතනය විසින් සම්පූර්ණ රඳවා ගැනීමේ මුදල් නිදහස් කරන ලෙස කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම මත සම්පූර්ණ රඳවා තබා ගැනීම ආවරණය කිරීම සඳහා ඉදිකිරීම් ඇපකර අරමුදල (CGF).

e. කොන්ත්‍රාත් කාලය නොසලකා සියලුම වැඩ කොන්ත්‍රාත්තු සඳහා CIDA මිල උච්චාවචන සූත්‍රය අනුව කොන්ත්‍රාත්කරුවන්ට වන්දි ලබා දීම සහ කොන්ත්‍රාත්තු ලේඛනවල මිල ගැලපීම් සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන ආයතන විසින් මිල උච්චාවචන සූත්‍රය භාවිතා කිරීම අවශ්‍ය වේ.

f. ජාත්‍යන්තරව පිළිගත් FIDIC කොන්ත්‍රාත් ප්‍රතිපාදන අනුව සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්කරුට ගෙවීම ප්‍රමාද වුවහොත්, පොලී ගණනය කිරීම සඳහා දැනට භාවිතා කරන නෛතික අනුපාතයට 1% එකතු කරනවා වෙනුවට, බැංකු අනුපාතයට 3%ක් එකතු කර ගෙවීම් කිරීම.

g. යාන්ත්‍රික, විදුලි සහ ජලනල (MEP) ආශ්‍රිත උපකරණ ආනයනය කිරීමේදී, සේවා යෝජකයින් හුවමාරු වීම වළක්වා ගැනීම සඳහා නම් කරන ලද උප කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් සමඟ ඍජුවම ත්‍රි-පාර්ශ්වික ගිවිසුම අත්සන් කිරීමෙන් එකඟ වූ නියමයන් සහ කොන්දේසි සහිතව එක් එක් ව්‍යාපෘතිය සඳහා ණයවර ලිපි (LCs) විවෘත කළ යුතුය. අනුපාතය අවදානම.

h. අමාත්‍යාංශයේ විෂය පථය තීරණය කිරීමේදී ඉදිකිරීම් කර්මාන්තයේ විෂය නාමයෙන් අමාත්‍යාංශයක් නම් කිරීමට සුදුසු පියවර ගැනීම. සියලුම අංශ සඳහා (අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහන, වාරිමාර්ග, ජල සම්පාදන ආදී) අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයේ කොඳු නාරටිය ඉදිකිරීම් කර්මාන්තය බැවින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා නම් කරන ලද අමාත්‍යාංශයක් පිහිටුවීමට දැන් කාලය පැමිණ තිබේ.

i. බලතල සහිත සාමාජිකයින්ගෙන් සමන්විත ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර මෙහෙයුම් කමිටුව (SSCC) පිහිටුවීම.

13. 2022 වසර සඳහා සාමාජික ගාස්තුව (USD 3,300) නොගෙවීම හේතුවෙන් IFAWPCA සංගමය / ආයතනය අපගේ සාමාජිකත්වය අත්හිටුවන ලදී. 2023 දී සියලුම ගෙවීම් සිදු කරන ලද අතර NCASL වෙත නිසි පිළිගැනීමක් ලබා දෙමින් නේපාලයේ කත්මන්ඩු නුවර 2024 දී හා, මෙම වසරේ අප්‍රේල් මස සිංගප්පූරුවේ දී පැවති IFAWPCA සම්මුතිය සඳහා NCASL සහභාගී විය.

14. NCASL ලේකම් කාර්යාලයේ මූල්‍ය විනය 2022/2023 සහ 2023/2024 සැසිවලදී පවත්වා ගෙන ගොස් ඇත. ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය අඩු කිරීම අඩු කිරීමඇතුළු අනවශ්‍ය වියදම් කපා හැර තිබේ. එමගින් තවත් වසර 02ක් සඳහා ලේකම් කාර්යාලය සහ ශාඛා පවත්වාගෙන යාමට මුදල් ඉතිරි වී ඇත. ආර්ථික අර්බුදය අතරතුර, ඉදිකිරීම් ප්‍රදර්ශනයේ අරමුදල ඥානවන්තව භාවිතා කරන අතර හදිසි අවස්ථාවක දී භාවිතා කිරීමට වෙන් කර ඇත. තවද සංගමය නමින් හා ප්‍රදර්ශන අරමුදල ප්‍රදර්ශන අරමුදල නමින් බැංකු ගිණුම් 2ක් විවෘත කර ඒවායේ ලැබීම් හා ගෙවීම් බලාගැනීමට පහසු කර ඇත. තවද, ඉදිකිරීම් ප්‍රදර්ශනය 2023 දක්වා පැවැත්වීමෙන් කිසිදු මුදලක් අප සංගමය වෙත ඉතිරි වී නොමැති වුවද පසුගිය වසර දෙක තුල පමණක් රුපියල් මිලියන 16.7 ලාභයක් උපයා ගෙන ඇත. එම මුදල්, පහත 15 ඡේදයේ සඳහන් පරිදි ගොඩනැගිල්ල නඩත්තු කිරීම සඳහා යොදවා ඇති අතර ඉතිරි මුදල් ස්ථාවර තැන්පතු ගිණුමක ගිණුම් ගත කර ඇත.

15. අවශ්‍ය නඩත්තුවක් නොමැතිකම හේතුවෙන් ශ්‍රවණාගාරය වසර හයක් වසා දමා තිබුණි. කෙසේ වෙතත්, එය දැන් ප්‍රතිසංස්කරණය කර ඇති අතර අපගේ කාර්යයන් සත්කාරකත්වය සැපයීමට සහ බාහිර කුලියට දීම සඳහා භාවිත කළ හැකි තත්ත්වයක පවතී. මෙම ගොඩනැගිල්ල සැලකිය යුතු ප්‍රතිසංස්කරණයකට භාජනය විය, විශේෂයෙන් වැසිකිලි, වසර ගණනාවක් තිස්සේ භාවිතයට නුසුදුසු

තත්ත්වයට පත් විය. තවද වසර ගණනාවකින් තීන්ත අලේප කර නොතිබූ අතර, අභ්‍යන්තර තීන්ත අලේප කිරීම සිදුකරන ලදි.

16. 2016 / 2017 වර්ෂවල, අප සංගමයේ VAT ගෙවීම් සම්බන්ධයෙන් වූ ප්‍රශ්න, නිරාකරණය කර ගැනීමට හැකි විය.
17. 2020 / 2021 වර්ෂ වල බදු මුදල් නිසියාකාරව හිඟ වීම නිසා රුපියල් මිලියන 18 ක පමණ දඩ මුදලක් නියම කර ඇත. එය නිවැරදි කිරීම සඳහා උපදේශකවරයකුගේ සහාය ඇතිව වැඩ කටයුතු කරමින් සිටියි.

18. සංගමයේ හා ප්‍රදර්ශන වෙබ් අඩවි සැහෙන කාලයක් යාවත්කාලීන කර නොතිබූ අතර ඒවා යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත.

19. සියළුම ශාඛා සඳහා වෙන වෙනම WhatsApp Group පිළියෙළ කිරීමට පියවර ගෙන ඇති අතර ඉදිරියේදී එය මඟින් සියළුම සමජිකියින් මෙන්ම ඔබ පළාතේ සිටින සියළුම අනෙකුත් ඉදිකිරීම් කරුවන්ට සන්නිවේදන ජාලයක් ඇති වනු ඇත.

20. හිටපු සභාපතිවරයෙකු ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව වැරදි ප්‍රකාශ නිකුත් කරමින් කරන්නාවූ හානිය පිළිබඳව ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වා, එම වැරදි ප්‍රකාශ නිවරදි කිරීමට පියවර ගෙන ඇත.

මව් සංගමය මගින් සිදුකරනු ලබන දුෂ්කර කර්තව්‍යයන් බොහෝ දෙනෙකු නොදන්නා බැවින් අපගේ සාමාජිකයන් වුවත් නැතත් මෙම තොරතුරු ඔබ ප්‍රදේශයේ ඉදිකිරීම් කරුවන් අතර ප්‍රචාරය කරන මෙන් ඉල්ලා සිටිමු. අපගේ සංගමයට සාමාජිකයින් නොවන අය බඳවා ගැනීමට ධනාත්මකව ක්‍රියාමාර්ග ගන්නා ලෙසද අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

මේ සම්බන්ධයෙන් ඔබගේ කඩිනම් අවධානය සහ ක්‍රියාමාර්ගය ඉතා අගය කරනු ඇත.

ස්තුතියි.
මීට විශ්වාසී,
**ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය**

ඉංජි. ආර්. බී. එම්. ගුණවර්ධන
ප්‍රධාන විධායක නිලධාරී